ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

13 ශ්‍රේණිය	33	S	I	ගිණුම්කරණය I Accounting I	කාලය : පැය දෙකයි Time : Two hours

උපදෙස් :

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- අංක **01** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු හිමි වේ.

01. මූල්‍ය ගිණුම්කරණයේ අරමුණ වඩාත් හොඳින් විස්තර කරන ප්‍රකාශය,
(1) ව්‍යාපාරයේ කළමනාකරුවන්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම.
(2) ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම.
(3) ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන්ට එම ව්‍යාපාර ඒකකය සම්බන්ධව තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම.
(4) ව්‍යාපාර ඒකකයේ මූල්‍ය තත්ත්වය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පිළිබඳ කළමනාකරුවන්ට තීරණ ගැනීමට තොරතුරු සැපයීම.
(5) ආයෝජකයන්ට ව්‍යාපාර ඒකකයට සම්පත් සැපයීම සම්බන්ධව තීරණ ගැනීමට තොරතුරු සැපයීම.
(.........)

02. ගිණුම්කරණ පරිසර සාධකය සහ ඊට අදාළ විචල්‍යයන් කිහිපයක් පහත දැක්වේ.

1. ශිල්පීය හා වෘත්තීය පරිසරය	a. රාජ්‍ය ප්‍රතිපත්ති
2. නෛතික පරිසරය	b. ජන සංක්‍රමණ
3. තාක්ෂණික පරිසරය	c. ගිණුම්කරණ විගණන ප්‍රතිපත්ති
4. ආර්ථික හා දේශපාලන පරිසරය	d. ගිණුම්කරණ ප්‍රමිත
5. සමාජ හා සංස්කෘතික පරිසරය	e. ප්‍රාග්ධන සූක්ෂම ක්‍රම භාවිතය

ඉහත පරිසර සාධකය සමඟ විචල්‍යයන් ගැළපූ නිවැරදි අනුපිළිවෙළ වන්නේ,
(1) d c e a b (2) d e c a b (3) c d e a b
(4) e d c b a (5) b d e a c (.........)

- 03, 04, 05 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

අනුර විසින් 2023.04.01 රු.1000 000 ක ප්‍රාග්ධනය යොදවා ව්‍යාපාරයක් ආරම්භ කළ අතර, පළමු මාසය තුළ පහත ගනුදෙනු සිදු විය.

2023.04.02 අත්පිට ගැනුම් රු. 400 000
2023.04.05 රු.100 000 ක තොගයක් රු.125 000 කට මිහිරිට ණයට විකිණීම.
2023.04.08 ණයට විකිණූ පිරිවැය 20 000 ක තොගයක් මිහිරි විසින් ආපසු හරවා එවීම.
2023.04.25 5% වට්ටමක් අඩු කළ පසු මිහිරි විසින් සම්පූර්ණ මුදල පියවීම.
2024.04.30 මාසික විදුලි බිල පියවීම රු.3000

03. ඉහත ගනුදෙනු (2024.04.02 සිට) අනුරගේ පොත් වල සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛන දැක්වෙන අනුපිළිවෙළ වන්නේ,
(1) ලදුපත, ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය, ලදුපත
(2) ගෙවීම් වවුචරය, ඉන්වොයිසිය, හරපත, ලදුපත, ගෙවීම් වවුචරය
(3) ගෙවීම් වවුචරය, ඉන්වොයිසිය, ලදුපත, හරපත, ලදුපත
(4) ලදුපත, ඉන්වොයිසිය, හරපත, ලදුපත, ගෙවීම් වවුචරය
(5) ගෙවීම් වවුචරය, ඉන්වොයිසිය, බැරපත, ලදුපත, ගෙවීම් වවුචරය (.........)

04. ඉහත ගනුදෙනු මිහිරිගේ පොත්වල වාර්තා කිරීමට යොදා ගන්නා මූලික සටහන් පොත් අනුපිළිවෙළ වන්නේ,

(1) ලැබීම් ජ'නලය, ගෙවීම් ජ'නලය, ගැනුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය, ගෙවීම් ජ'නලය.

(2) විකුණුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය, ගෙවීම් ජ'නලය.

(3) ගෙවීම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය, ලැබීම් ජ'නලය, ගෙවීම් ජ'නලය.

(4) ගැනුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, ගෙවීම් ජ'නලය.

(5) විකුණුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, ලැබීම් ජ'නලය, ගෙවීම් ජ'නලය. (.........)

05. 2023.04.08 සිදු වූ ගනුදෙනුව මිහිරිගේ ව්‍යාපාරයේ සටහන් කරනු ලබන නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

(1) ආපසු එවුම් (හර) 20000
ණය ගැති (බැර) 20000

(2) ණය හිමි (හර) 25000
ආපසු යැවුම් (බැර) 25000

(3) ආපසු එවුම් (හර) 25000
ණය ගැති (බැර) 2500

(4) ණය හිමි (හර) 20000
ආපසු යැවුම් (බැර) 20000

(5) විකුණුම් (හර) 25000
ණය ගැති (බැර) 25000

06. ආදායම හඳුනා ගැනීමේ දී එය සත්‍ය වශයෙන්ම ඉපැයූ අවස්ථාව යොදාගත යුතු බව දැක්වෙන ගිණුම්කරණ සංකල්පය කුමක් ද?

(1) උපලබ්ධි සංකල්පය (2) ආරක්ෂණ සංකල්පය (3) ගැලපුම් සංකල්පය
(4) ගැලපුම් (5) යථාරූපී සංකල්පය (.........)

07. එක් එක් කාලච්ඡේදයේ විකුණුම් පිරිවැය ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලබන්නේ කුමන සංකල්පයට අනුකූලව ද?

(1) උපලබ්ධි (2) ආරක්ෂණ (3) යථාරූපී
(4) ගැලපුම් (5) අනාවරණ (.........)

- 08, 09 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

මිනිදු ව්‍යාපාරයේ 2024.03.31 දිනෙන් අවසන් මාසයේ බැංකු ප්‍රකාශනයේ ශේෂය එදිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සමඟ එකඟ නොවීය. 2024.03.01 දින බැංකු ප්‍රකාශයේ ශේෂය සහ මුදල් පාලන ගිණුමේ ශේෂය වෙනස් වීමට පහත දැක්වෙන දෑ හේතු විය.

- උපලබ්ධි නොවූ චෙක්පත් රු.20 000
- ඉදිරිපත් නොවූ චෙක්පත් රු.15 000
- 2024/03/01 දින මුදල් පාලන ගිණුමේ ශේෂය රු.150 000 ක් විය.

මාසය තුළ පහත තොරතුරු සපයා ඇත.

	මුදල් පාලන ගිණුම අනුව	බැංකු ප්‍රකාශය අනුව
තැන්පත් කළ චෙක්පත්	180 000	188 000
නිකුත් කළ චෙක්පත්	165 000	170 000

- බැංකු ගාස්තු රු.2 000
- බැංකු ණය වාරික (ස්ථාවර නියෝග) රු. 25 000
- ණයගැති ප්‍රේෂණ රු. 28 000

08. 2024.03.31 දිනට සංශෝධිත මුදල් පාලන ගිණුම අනුව ශේෂය වන්නේ,

(1) රු. 165 000 (2) රු. 200 000 (3) රු. 166 000
(4) රු. 168 000 (5) රු. 164 000 (.........)

09. 2024.03.31 දිනෙන් අවසන් මාසයේ බැංකු ප්‍රකාශය අනුව ශේෂය වන්නේ,

(1) රු. 165 000 (2) රු. 166 000 (3) රු. 164 000
(4) රු. 168 000 (5) රු. 200 000 (.........)

10. තරුෂ ව්‍යාපාරයේ 2024.03.31 සිදු වූ ගින්නක් හේතුවෙන් එහි පැවති තොගය සම්පූර්ණයෙන්ම විනාශ විය. රක්ෂණ සමාගම විසින් 80% ක වන්දි ගෙවීමට එකඟතාවය දක්වා ඇත. පහත තොරතුරු ඔබට සපයයි.

2024.4.1 තොගය	150 000
ගැණුම්	2 400 000
ආපසු යැවුම්	100 000
විකුණුම්	2 800 000

විකුණුම් මිල මත 20% ලාභ ප්‍රතිශතයක් පවත්වා ගැනීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. මෙම ව්‍යාපාරයේ විනාශ වූ තොගය හා තොග හානි අලාභය දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

	හානි වූ තොගය (රු.)	**තොග හානි අලාභය (රු.)**
(1)	210 000	168 000
(2)	310 000	62 000
(3)	466 000	93 000
(4)	310 000	248 000
(5)	210 000	42 000

(.........)

11. බිනුර සමාගම් 2024 මාර්තු මාසය සඳහා තොග සම්බන්ධ පහත තොරතුරු සපයා ඇත.

දිනය	**විස්තරය**	**ප්‍රමාණය (ඒකක)**	**පිරිවැය**
03/01	ශේෂය	1 000	?
03/18	ගැනුම්	7 000	56 000
03/27	විකුණුම්	5 000	49 000

තොග නිකුත් කිරීම් මිල කිරීම සඳහා FIFO අනුගමනය කරයි. ඒ අනුව පහත දෑ ගණනය කරන්න.

	2024.03.01 තොගයේ වටිනාකම	**2024.03.31 තොගයේ වටිනාකම**
(1)	රු. 8 000	රු. 16 000
(2)	රු. 7 000	රු. 14 000
(3)	රු. 16 000	රු. 8 000
(4)	රු. 7 500	රු. 15 000
(6)	රු. 14 000	රු. 7 000

(.........)

12. 2023.01.01 ආරම්භ කළ "Paradies" ක්‍රීඩා සමාජයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයයි.

සාමාජික මුදල් ලැබීම	**රු.**
• 2023 වර්ෂය සඳහා	450 000
• 2024 වර්ෂය සඳහා	25 000
2023/12/31 දිනට හිඟ සාමාජික මුදල	50 000
2023/7/1 දින ලද පරිත්‍යාග	500 000
2023/10/1 දින ක්‍රීඩා උපකරණ මිලට ගැනුම්	500 000
වියදම් (ක්ෂය හැර)	225 000
2023/12/31 වගකීම්	50 000

පරිත්‍යාගය ක්‍රීඩා උපකරණ මිල දී ගැනීමට ලද අතර ලද දිනයේ සිට වසර 5 ක් තුළ සමානව ආදායමේ හඳුනා ගනී.

ක්‍රීඩා උපකරණ වල ඵලදායී ජීව කාලය වසර 5 ක් වේ.

2023.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය / ඌනතාවය සහ එදිනට මුළු වත්කම් වන්නේ,

	අතිරික්තය / ඌනතාවය	**මුළු වත්කම්**
(1)	550 000	750 000
(2)	300 000	800 000
(3)	800 000	300 000
(4)	325 000	775 000
(7)	300 000	750 000

(.........)

13. නිරෝෂා ව්‍යාපාරයේ පහත තොරතුරු සපයා ඇත.

2023/4/1 තොගය රු. 450 000
2023/4/1 ණය හිමි රු. 1 000 000
2023/3/31 තොගය රු. 250 000
2024/3/31 ණය හිමි රු. 650 000
වර්ෂය තුළ ණයහිමියන්ට ගෙවීම් 5 350 000

ව්‍යාපාරයේ විකුණුම් මිලට 20% ක ලාභ ප්‍රතිශතයක් තබා ගනිමින් ව්‍යාපාර කටයුතු සිදු කරයි නම්, 2024/3/31 න් අවසන් වර්ෂයේ මෙම ව්‍යාපාරය දළ ලාභය කොපමණ වේද?

(1) රු. 1 300 000 (2) රු. 6 500 000 (3) රු. 5 200 000
(4) රු. 1 150 000 (5) රු. 5 000 000 (.........)

14. A, B, C හවුල් ව්‍යාපාරය සම්බන්ධයෙන් පහත තොරතුරු ඉදිරිපත් කර තිබේ.

- හවුල් කරුවන්ගේ ප්‍රාග්ධන පොලී,
  A – 50 000 B – 50 000 C – 40 000
- හවුල් වේතන, A - මසකට 15 000 බැගින්
  B හා C - මසකට 20 000 බැගින්
- C විසින් ව්‍යාපාරයට ප්‍රාග්ධනයට අමතරව සපයා ඇති ණය මුදල රු.500 000 ක් වන අතර, ඒ සඳහා 10% වාර්ෂිකව පොලී ගෙවීමට එකඟ වී ඇත.
- හවුල් කරුවන්ගේ ලාභ කොටස්
  A – 100 000 B – 100 000 C – 80 000
- B ට අයත් ගොඩනැගිල්ලක් ව්‍යාපාරයට ලබා දී ඇති අතර එහි වාර්ෂික කුලිය රු. 75 000 කි.

මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වන්නේ,

(1) රු. 280 000 (2) රු. 1 205 000 (3) රු. 600 000
(4) රු. 1 080 000 (5) රු. 955 000 (.........)

- 16, 17 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

අනුර, බිනුර, චනුර පවත්වාගෙන හවුල් ව්‍යාපාරයේ 2023.4.1 දින චනුර විශ්‍රාම ගැනීමට තීරණය කරන ලදි. ඔවුන්ගේ ලා/ලා අනුපාතය පිළිවෙළින් 5 : 3 : 2 විය. 2023.4.1 ගිණුම් ශේෂ පහත පරිදි විය.

<u>ප්‍රාග්ධන ගිණුම්</u>	අනුර	5 000 000
	බිනුර	3 000 000
	චනුර	2 000 000

<u>ජංගම ගිණුම්</u>

අනුර	(100) (හර)
බිනුර	150 බැර
චනුර	80 බැර

හවුල් ගිවිසුම පහත පරිදි වේ.

- ප්‍රාග්ධනය මත පොලිය 10% ක් වේ. (ගිණුම් කාලච්ඡේදය ආරම්භක ශේෂය)
- හවුල්කරුවෙකුට මසකට රු.20 000 බැගින් සියලු හවුල්කරුවන්ට වේතන හිමි වේ.

චනුර විශ්‍රාම ගිය පසු අනුර හා බිනුර 3 : 2 අනුපාතයට ලාභාලාභ බෙදා ගැනීමට එකඟ විය. ඔහු විශ්‍රාම යන දිනට ඔහුගේ කීර්තිනාම කොටස 30 000 ක් විය. හවුල් ගිවිසුමේ අනෙකුත් කොන්දේසි නොවෙනස්ව පවත්වා ගනී. 2024.3.31 අවසන් වර්ෂය තුළ ව්‍යාපාරය ඉපැයූ ලාභය 1627 000 ක් වේ.

15. මෙම ව්‍යාපාරයේ 2023.4.1 දින කීර්ති නාමයේ වටිනාකම වන්නේ,
    (1) රු. 30 000 (2) රු. 300 000 (3) රු. 90 000
    (4) රු. 120 000 (5) රු. 150 000 (.........)

16. 2024.3.31 දිනට අනුර හා බිනුරගේ මුළු හිමිකම පිළිවෙළින්,
    (1) රු. 848 500 හා රු. 828 500 (4) රු. 5 833 500 හා රු. 3 813 500
    (2) රු. 4 985 000 හා රු. 2 885 000 (5) රු. 4 900 000 හා රු. 3 130 000
    (3) රු. 210 000 හා රු. 140 000 (.........)

17. 2023/4/1 චනුරගේ හිමිකම ණය ගිණුමකට මාරු කරන ලද්දේ නම්, 20243/3/31 අවසන් වර්ෂය තුළ ඔහුට ගෙවිය යුතු ණය පොලිය 1890 හවුල් ආඥා පනත 42 වගන්ති අනුව,
    (1) රු. 105 500 (2) රු. 40 000 (3) රු. 101 500
    (4) රු. 104 000 (5) රු. 100 000 (.........)

18. චතිල ගේ ව්‍යාපාරයේ 2024 මාර්තු මස පහත වැරදි සිදු වී ඇති බව අනාවරණය කර ගන්නා ලදි.
    - රු.2500 ක ලද වට්ටමක් දුන් වට්ටමක් ලෙස වාර්ති කිරීම.
    - රු.12000 ක ආපසු යැවුම් රු.21000 ක් ආපසු එවුම් ලෙස වාර්තා කිරීම.

    මෙම වැරදි නිසා හට ගන්නා අවිනිශ්චිත ගිණුමේ ශේෂය,

    (1) රු. 38 000 (හර) (2) රු. 33 000 (හර) (3) රු. 33 000 (බැර)
    (4) රු. 38 000 (බැර) (5) රු. 23 500 (හර) (.........)

19. 'සිංහ' පලතුරු බීම නිෂ්පාදන ආයතනයක 2024.3.31 වර්ෂය තුළ පහත තොරතුරු සපයා ඇත.
    ඒකකයක විකුණුම් මිල 180
    2024/3/31 දිනට විකිණූ ඒකක ගණන 10 000
    2024/3/31 දිනට නොවිකිණූ ඒකක ගණන 500
    2023/4/1 දින පලතුරු බීම කිසිවක් නොවීය.

ඒකකයක් පිරිවැයට 20% ලාභ ප්‍රතිශත සහිතව විකුණනු ලබයි. කාලච්ඡේදයේ මුළු නිෂ්පාදිත පිරිවැය වන්නේ,

(1) රු. 1 890 000 (2) රු. 1 575 000 (3) රු. 1 425 000
(4) රු. 1 710 000 (5) රු. 1 500 000 (.........)

20. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය තොරතුරු වල වැඩිදියුණු කිරීමේ ලක්ෂණයක් නොවන්නේ,

(1) සත්‍යාපනය කළ හැකි වීම. (2) විශ්වසනීය නියෝජනය (3) කාලීන බව
(4) අවබෝධකරගත හැකි බව (5) සංසන්දනාත්මක බව (.........)

21. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව වගකීමක ලක්ෂණ වන්නේ,

A. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස හට ගැනීම.
B. ආර්ථික සම්පත් පවරාදීමක් පැවතීම.
C. වර්තමාන බැඳීමක් පැවතීම.
D. විශ්වසනීයව ඇස්තමේන්තු කළ හැකි වීම.

(1) A, B පමණි. (2) A, B, C පමණි. (3) A, C පමණි.
(4) B, C පමණි. (5) A, B, C, D සියල්ලම. (.........)

22. LKAS 16 දේපල පිරියත උපකරණ ප්‍රමිතියට අනුව පහත ප්‍රකාශ වලින් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) වත්කමක පිරිවැය එම වත්කමේ ඵලදායි ජීවිත කාලය පුරා ක්‍රමානුකූලව විභජනය කිරීම ක්ෂය වීම් වේ.
(2) වත්කමක පිරිවැය හෝ පිරිවැයට ආදේශ කර ඇති අගයකින් අවශේෂ අගය අඩු කළ පසු අගය ක්ෂය කළ හැකි අගය වේ.
(3) අතේ දුරින් වූ ගනුදෙනුවක දී දැනුම හා කැමැත්ත ඇති පාර්ශව අතර සිදුවන වත්කමක් හුවමාරු කළ හැකි අගය හා වගකීම බේරුම් කළ හැකි අගය සාධාරණ අගය නම් වේ.
(4) වත්කම නියමිත තත්ත්වයෙන් භාවිතා කිරීමට අපේක්ෂිත කාලය හෝ එයින් අපේක්ෂිත නිමවුම් ඒකක ප්‍රමාණය ඵලදායී ජීවිත කාලය නම් වේ.
(5) පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය හා සමුච්චි හානිකරණ අලාභ අඩු කළ පසු අගය ධාරණ වටිනාකම වේ.

(.........)

- සීමිත දසුන් පොදු සමාගමේ 2024.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අදාළ වේ.

	රු. 000
විකුණුම්	8500
විකුණුම් පිරිවැය	3500
මෝටර් රථ විකුණුම් ලාභ	1500
මෙහෙයුම් වියදම්	3200
සා.කො. සඳහා අතුරු ලාභාංශ ගෙවීම	1200
මෝටර් රථ ප්‍රත්‍යාගණන අතිරික්තය	220
ගොඩනැගිලි ප්‍රත්‍යාගණන හිඟය	150

- 2023.3.1 දිනෙන් අවසන් වසරේ ගොඩනැගිලි පළමුවරට ප්‍රත්‍යාගණන කිරීමේ දී රු.120 000 ක අතිරික්තයක් වාර්තා කර තිබුණි.
- මෝටර් රථ 2024.3.31 පළමු වරට ප්‍රත්‍යාගණනය කර ඇත.
- රඳවාගත් ඉපැයුම් ගිණුමේ 2023.4.1 දිනට ශේෂය රු.765 000 විය.
- ව්‍යාපාරය බදු නිදහස් කාලයක් තුළ ක්‍රියාත්මක වේ.

- ඉහත තොරතුරු මත **23, 24, 25** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

23. LKAS 01 අනුව 2024.3.31 දිනෙන් අවසන් වර්ෂයේ මුළු ආදායම හා මුළු වියදම වන්නේ,

	මුළු ආදායම "000"	**මුළු වියදම "000"**
1.	10220	6850
2.	6500	3200
3.	10220	6730
4.	10100	6850
5.	3370	6700

(.........)

24. LKAS 1 අනුව 2024.3.31 අවසන් වර්ෂයේ ලාභය හා වෙනත් විස්තීර්ණ ආදායම වන්නේ,

	කාලච්ඡේදයේ ලාභය "000"	වෙනත් විස්තීර්ණ ආදායම "000"
(1)	3270	70
(2)	3300	160
(3)	3270	100
(4)	3150	190
(5)	3370	70

(.........)

25. LKAS 1 අනුව 2024.3.31 අවසන් වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම හා එදිනට රඳවාගත් ඉපැයුම් කොපමණ ද?

	මුළු විස්තීර්ණ ආදායම "000"	රඳවාගත් ඉපැයුම් "000"
(1)	3300	3080
(2)	3370	4035
(3)	3370	4065
(4)	3300	4065
(5)	3370	3195

(.........)

26. ව්‍යාපාරයක EPF සේවක දායකත්වය 10% ක් හා සේවය දායකත්වය 15% ක් වේ. සේවකයන්ට ගෙවන ලද ශුද්ධ වැටුප රු.600 000 වන අතර වැටුප් අත්තිකාරම් රු.120 000 ක් හා EPF සේවක දායකය අඩු කර වැටුප් ගෙවා ඇත. මෙම ව්‍යාපාරයේ දළ වැටුප් වියදම හා EPF වියදම කොපමණ ද?

	දළ වැටුප් වියදම	**EPF සේව්‍ය දායකය**
(1)	රු. 800 000	රු. 80 000
(2)	රු. 720 000	රු. 72 000
(3)	රු. 480 000	රු. 72 000
(4)	රු. 720 000	රු. 108 000
(5)	රු. 800 000	රු. 120 000

(.........)

27. අංජලීගේ ව්‍යාපාරයේ X නැමැති භාණ්ඩය සම්බන්ධව පහත තොරතුරු දී ඇත.

- මාසික තොග ඉල්ලුම ඒකක 5000
- තොග ඒකකයක මිල රු.100
- තොග ඇණවුමක පිරිවැය රු.30
- තොග ඒකකයක් වර්ෂය පුරා රඳවා ගැනීමේ පිරිවැය තොග ඒකකයක මිලෙන් 10% කි.

X අයිතමයේ ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) හා ඇණවුම් වාර ගණන කොපමණ ද?

(1) ඒකක 100 වාර 60 (2) ඒකක 600 වාර 10 (3) ඒකක 60 වාර 100
(4) ඒකක 600 වාර 100 (5) ඒකක 3600 වාර 36 (.........)

28. ධනුලිගේ ව්‍යාපාරයේ පහත තොරතුරු ඔබට සපයා ඇත.

ජංගම අනුපාතය	3 : 2
මුළු වත්කම්	1 000 000
ජංගම නොවන වගකීම්	450 000
හිමිකම	350 000
කාරක ප්‍රාග්ධනය	100 000

ඉහත තොරතුරු අනුව 2024.3.31 දිනට ජංගම වත්කම් කොපමණ ද?

(1) රු. 800 000 (2) රු. 450 000 (3) රු. 200 000
(4) රු. 300 000 (5) 550 000 (.........)

29. වර්ෂාගේ ව්‍යාපාරයේ පහත තොරතුරු 2024.3.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ වේ.

දායක විකුණුම් අනුපාතය 40%
ඒකකයක විචල්‍ය පිරිවැය රු. 600
ඒකක 1000 නිපදවීමේ දී ලාභය රු. 150 000

මෙම ව්‍යාපාරයේ ස්ථාවර පිරිවැය කොපමණ වේද?

(1) රු. 250 000 (2) රු. 450 000 (3) රු. 300 000
(4) රු. 150 000 (5) 200 000 (.........)

30. ව්‍යාපෘතියකට අදාළව ශුද්ධ මුදල් ප්‍රවාහයක් පහත පරිදි හඳුනාගෙන ඇත.

වර්ෂය	**0**	**1**	**2**	**3**	**4**
ශුද්ධ මුදල් ප්‍රවාහය	(1500)	500	550	600	750
වට්ටම සාධකය	1	0.9	0.8	0.7	0.6

ඉහත ව්‍යාපෘතියට අදාළ ව ශුද්ධ වර්තමාන අගය සහ පිළිගෙවුම් කාලය වන්නේ,

	ශු.ව.අ.	**පිළිගෙවුම් කාලය**
(1)	+ 260	අවු. 3 මාස 9
(2)	– 260	අවු. 2 මාස 9
(3)	+ 900	අවු. 2 මාස 5
(4)	+ 900	අවු. 3 මාස 5
(5)	+ 260	අවු. 2 මාස 9

(.........)

31. කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය ගිණුම්කරණය අතර ප්‍රධාන වෙනස්කම් සඳහන් කරන්න.

	මූල්‍ය ගිණුම්කරණය	**කළමනාකරණ ගිණුම්කරණය**
(1)	....	....
(2)	....	....
(3)	....	....
(4)	....	....
(5)	....	....

32. පහත දැක්වෙන එක් එක් කරුණු හා සම්බන්ධ වන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

<u>සංකල්පය</u>

(1) සමාගමක අධ්‍යක්ෂවරයෙක් ව්‍යාපාරයෙන් ලබාගත් ණය මුදල කෙතරම් කුඩා වුවත් එය අනාවරණය කිරීම. ....
(2) විකුණුම් සඳහා ලද අත්තිකාරම විකුණුම් ආදායමේ හඳුනා නොගැනීම. ....
(3) අයිතිකරුගේ පෞද්ගලික වියදම් ව්‍යාපාරයේ වියදම් වලින් වෙන්කොට දැක්වීම. ....
(4) දේපළ පිරියත උපකරණ මිල දී ගත් අවස්ථාවේ වටිනාකම පිරිවැයට වාර්තා කිරීම. ....

(.........)

33. රශ්මිගේ ව්‍යාපාරයේ පහත දැක්වෙන ගනුදෙනු වල ශුද්ධ ප්‍රතිඵලය දී ඇති ගිණුම්කරණ සමීකරණය තුළ දක්වන්න.

වත්කම්	=	වගකීම්	+	හිමිකම්
....	=	....	+	....

(A) රු.500 000 පිරිවැය වූ තොගයක් පිරිවැයට 20% ලාභ සහිතව ණයට විකිණීම.
(B) ඉහත ණයගැති වටිනාකමක් 50% ක් පියවීම සඳහා මුදල් ලැබීම. එහිදී දුන් වට්ටම 5% කි.
(C) ණයගැතියන්ගෙන් ලද රු.24000 ක චෙක්පත අගරු වී ඇති අතර එහිදී අහිමි වන දුන් වට්ටම 1000 කි.
(D) රු.10 000 ක කපා හල බොල්ණයක් ආපසු ලැබීම. (.........)

34. පහත දැක්වෙන එක් එක් ගිණුම්වලට අයත් මූලිකාංගය දක්වන්න.
(i) ආපසු එවුම් ....
(ii) ආපසු යැවුම් ....
(iii) සාමාජික මුදල් ....
(iv) ක්ෂය වෙන් කිරීම ....

35. පහත එක් එක් ගනුදෙනුව වාර්තා කරනු ලබන මූලික සටහන් පොත ලියන්න.
(A) මෝටර් රථයක් තවත් මෝටර් රථයක් සමඟ හුවමාරු කිරීම. ....
(B) බොල්ණය ලියා හැරීම. ....
(C) ලද වට්ටම් ගිණුම්ගත කිරීම ....
(D) උපචිත විදුලි වියදම ගැලපීම ....

36. සඳුන්ගේ ව්‍යාපාරයේ 2024.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගණනය කළ දළ ලාභය 800 000 ක් විය. දළ ලාභය ගණනය කර ඇත්තේ විකුණුම් මිලට 25% ක ලාභ ප්‍රතිශතයක් එකතු කරමින්ය. නමුත් විකුණුම් පිරිවැය ගණනයේ දී පහත වැරදි සිදු වී ඇත.

2024.3.31 දිනට අවසන් තොගය 50000 කින් අධි තක්සේරු වී ඇත.
2023.4.1 දින ආරම්භක තොගය 25000 කින් අවතක්සේරු වී ඇත.

(අ) 2024.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් ආදායම කොපමණ ද?
....
(ආ) 2024.3.31 දිනෙන් අවසන් වර්ෂය තුළ නිවැරදි ලාභය කොපමණ ද?
....

37. LKAS 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රමිතිය අනුව පහත එක් එක් ක්‍රියාකාරකම් කවර වර්ගීකරණයට අයත්දැයි ඉදිරියෙන් සලකුණු කරන්න.

	මෙහෙයුම්	ආයෝජන	මූල්‍ය
(i) ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම	....	....	....
(ii) කල්බදු ණය වාරිකය පියවීම	....	....	....
(iii) භාවිත අයිතිය ඇති වත්කම් වලට අදාළ මූලික ගෙවීම	....	....	....
(iv) සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම	....	....	....

38. LKAS 8 අනුව පහත සඳහන් දෑ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ද? ඇස්තමේන්තුවක් ද යන්න සඳහන් කරන්න.
(i) දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීමෙන් පසු මිනුම්කරණය සඳහා පිරිවැය ආකෘතිය හෝ ප්‍රත්‍යාගණන ආකෘතිය භාවිතා කිරීම. ....
(ii) තොග පිරිවැය ගණනය කිරීම සඳහා FIFO හෝ WAC භාවිතා කිරීම. ....
(iii) වත්කමක ඵලදායි ජීවිත කාලය ....
(iv) තොග වල ශුද්ධ උපලබ්ධි අගය ....

39. LKAS 10 වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම් ප්‍රමිතිය අනුව පහත සිද්ධීන් ගලපන්නේ ද නැද්ද යන්න සඳහන් කරන්න.

2024.3.31 න් අවසන් වර්ෂයට අදාළ මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024.06.30 දින අත්සන් තබන ලදි. වාර්ෂික මහ සභාව 2024.07.15 වේ.

(i) 2024.03.15 මිලදී ගත් යන්ත්‍රයක නියම මිල තීරණය වූයේ 2024.05.01 දිනය. ....

(ii) 2024.04.10 දින ආයෝජන වල වෙළඳපොළ අගය අඩුවීමක් දක්නට ලැබීම. ....

(iii) 2024.03.01 දින සේවයෙන් පහකළ සේවකයෙකු ගොනු කළ නඩුවක් මත වන්දි ගෙවිය යුතු බව 2024.05.30 තීන්දු විය. ....

(iv) ව්‍යාපාරයේ ප්‍රධාන යන්ත්‍රයක කොටසක් 2024.04.08 ගින්නෙන් හානි වීම. ....

40. 2024.01.01 සුළු මුදල් භාරකරුට ලබා දුන් අග්‍රිමයේ වටිනාකම රු.8000/= ක් විය. 01.31 දින අග්‍රිමය තවත් රු.2000 කින් වැඩිකොට අග්‍රිමය ප්‍රතිපූර්ණය සඳහා සුළු මුදල් භාරකරුට ලබා දුන් මුදල රු.9650 ක් විය. පෙබරවාරි මාසයේ සුළු වියදම් ප්‍රතිපූර්ණය 2/28 දින සිදු කරන ලදි. එදින සුළු මුදල් භාරකරු අත ඉතිරිව රු.1250/- ක් පැවතිණි.

(1) 2024.01.01 සිට 2024.2.28 දින දක්වා සුළු මුදල් භාරකරුට ලබා දී ඇති මුළු මුදල කොපමණ ද?

....

(2) ජනවාරි මාසයේ හා පෙබරවාරි මාසයේ සුළු වියදම් වෙන වෙනම දක්වන්න.

....

41. පියුමි හා තේජා අතර 2 : 1 අනුපාතයට පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයට 2024.3.31 දින $\frac{2}{6}$ ක ලාභ කොටසක් ලබා දීමේ එකගතාවයමත සඳුනි සම්බන්ධ විය. එදිනට එකඟ වූ කීර්ති නාමය රු.360 000 කි.

(i) නව ලාභාලාභ අනුපාතය කෙසේ වේද?

....

(ii) සඳුනි විසින් දායක විය යුතු කීර්ති නාමයේ වටිනාකම කොපමණ ද?

....

42. සීමිත තරුෂ පොදු සමාගම 2024.3.01 දින ලකුණු මිල රු.1 000 000 ක් වූ යන්ත්‍රයක් ආනයනය කළ අතර ඒ සඳහා 10% වෙළෙඳ වට්ටමක් ලැබුණි. පහත වියදම් යන්ත්‍රය හා සම්බන්ධ වේ.

නැව් ගාස්තු	50 000
තීරු බදු	23 000
VAT	200 000
වැඩබිම සැකසීම	25 000
මූලික පර්යේෂණය සඳහා ද්‍රව්‍ය හා ශ්‍රම පිරිවැය	17 000
මූලික පර්යේෂණ වටයේ භාණ්ඩ විකිණූ ආදායම	9 000
වෘත්තීය ගාස්තු	10 000
විවෘත කිරීමේ වියදම	15 000
සේවකයන් පුහුණු කිරීමේ වියදම	17 500
යන්ත්‍රය ස්ථාපනය කිරීමේ වියදම	28 000

මෙම ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇත.

LKAS 16 අනුව හඳුනාගත යුතු යන්ත්‍රයේ පිරිවැය කොපමණ ද? ....

43. සීමිත ශානුක සමාගමේ කල් බදු ක්‍රමයට ලබාගත් මෝටර් රථයක් සම්බන්ධව පහත තොරතුරු ලබා දී ඇත.

2023.04.01 මූලික ගෙවීම 200 000

2023.04.01 දරන ලද සෘජු පිරිවැය 100 000

රු.600 000 බැගින් ගෙවිය යුතු කල්බදු වාරික ගණන 04

කල්බද්දේ ගම්‍ය පොලී අනුපාතය 10% කි. එහි වට්ටම් සාධකය පහත දැක්වේ.

වර්ෂය	**1**	**2**	**3**	**4**
වට්ටම් සාධකය	0.9	0.8	0.7	0.6

SLFRS 16 කල්බදු ප්‍රමිතිය අනුව,

(a) 2023.04.01 මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත යුතු භාවිත අයිතිය සහිත වත්කමේ වටිනාකම කොපමණ ද?

....

(b) එදිනට හඳුනාගත යුතු කල්බදු වගකීම කොපමණ ද?

....

44. LKAS 37 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතිය අනුව පහත ප්‍රකාශ සත්‍ය / අසත්‍ය බව දක්වන්න.

(a) කාලය හෝ ප්‍රමාණය පිළිබඳ නිශ්චිතතාවයක් සහිත බැඳීම් ප්‍රතිපාදන නම් වේ. ....

(b) 'බැඳීම්' සම්මුතික හෝ නෛතික බැඳීමක් විය හැක. ....

(c) අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන තුළ වගකීම් ලෙස හඳුනා ගනී. ....

(d) අසම්භාව්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා නොගන්නා නිසා මිනුම් කිරීම අවශ්‍ය නොවේ. ....

45. සීමිත දිලේකා සමාගමේ නිෂ්පාදන අයිතමයන් හා සම්බන්ධව පහත තොරතුරු සපයා ඇත.

	උපරිම	**අවම**
සතියක පරිභෝජනය (ඒකක)	2500	1500
පොරොත්තු කාලය (සති)	08	04

යලි ඇණවුම් ප්‍රමාණය ඒකක 12 000 ක් වේ. පහත දෑ ගණනය කරන්න.

(i) උපරිම තොග මට්ටම ....

(ii) අවම තොග මට්ටම ....

46. ව්‍යාපාරයක පහත තොරතුරු ඔබට සපයා ඇත.

විකුණුම් ආදායම රු. 1 200 000 (සියලු විකුණුම් ණය පදනම මත වේ.)

දළ ලාභ අනුපාතය 20%

2023.4.1 ආරම්භක තොගය රු.60 000

2023.4.1 ආරම්භක ණය ගැති ශේෂය රු.400 000

කාලච්ඡේදය තුළ ණයගැතියන්ගෙන් ලද මුදල රු. 1 400 000

ගැණුම් රු. 1 000 000

පහත දෑ ගණනය කරන්න.

(i) තොග පිරිවැටුම් අනුපාතය ....

(ii) ණයගැති පිරිවැටුම් අනුපාතය ....

47. නදුන්ගේ ව්‍යාපාරයේ නිෂ්පාදන ඒකක සංඛ්‍යාව 80 000 ක් වේ. ඒකකයක ප්‍රාථමික පිරිවැය රු.65 ක් වන අතර එකලස් අංශයේ අන්තර්ග්‍රහන අනුපාතය යන්ත්‍ර පැයකට රු.30 කි. නිමවුම් අංශයේ අන්තර්ග්‍රහන අනුපාතය ශ්‍රම පැයකට රු.25 ක් වේ. ඒකකයක් සඳහා යන්ත්‍ර පැය 2 ක් ද ශ්‍රම පැය 3 ක් ද බැගින් ගත වේ. ඒ අනුව ඒකකයක මුළු පිරිවැය කොපමණ ද? ....

48. ව්‍යාපාරයක පහත තොරතුරු සපයා ඇත.

ඒකකයක විචල්‍ය පිරිවැය රු.600

දායක විකුණුම් අනුපාතය 60%

ඒකක 5000 ක් අලෙවියේ දී ලාභය රු.1 800 000 වේ.

(i) මෙම ව්‍යාපාරයේ ස්ථාවර පිරිවැය කොපමණ ද? ....

(ii) සම්ච්ඡේදන ලක්ෂ්‍යයේ දී විකුණුම් ඒකක සංඛ්‍යාව කොපමණ ද? ....

49. රු.2 000 000 ක ආයෝජනයක වසර 04 ක් අවසානයේ ශුද්ධ වර්තමාන අගය රු.300 000 ක් විය. මුල් වසර 03 හි ශුද්ධ වර්තමාන අගයන්ගේ එකතුව රු. 1 820 000 ක් වේ. වර්තමාන අගය සෙවීම සඳහා 10% වට්ටම් සාධකය යොදාගෙන තිබේ.

වර්ෂය	**1**	**2**	**3**	**4**
වට්ටම් සාධකය	0.9	0.8	0.7	0.6

(i) මෙම ව්‍යාපෘතියේ සිව්වන වසරේ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද? ....

(ii) ශුද්ධ වර්තමාන අගය ශුන්‍ය වීමට මූලික ආයෝජනය කොපමණ විය යුතුද? ....

50. මූලික ආයෝජනය රු.1 500 000 ක් වූ වසර 4 ව්‍යාපෘතියකට අදාළව ශුද්ධ මුදල් ප්‍රවාහයන් පිළිවෙළින් 500 000, 800 000, 600 000, 700 000 බැගින් වේ. මෙම ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය කොපමණ ද?

....

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

13 ශ්‍රේණිය	33	S	II	ගිණුම්කරණය II Accounting II	කාලය : පැය තුනයි Time : Three hours

අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි.
Additional Reading Time : 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් :

- **පළමුවන හා දෙවන ප්‍රශ්න** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
- අදාළ පෙර වැඩ පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

(1). සීමිත ප්‍රාර්ථනා පොදු සමාගමෙ 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

විස්තරය	හර (රු."000")	බැර (රු."000")
දේපළ පිරියත උපකරණ (2023.4.1)	97 000	
දේපළ පිරියත උපකරණ ක්ෂය වෙන්කිරීම් (2023.4.1)		14 350
2024.03.31 තොගය	7 500	
විකුණුම්		138 000
විකුණුම් පිරිවැය	58 000	
පරිපාලන වියදම්	8 300	
බෙදාහැරීමේ වියදම්	6 700	
ගෙවූ ලාභාංශ	300	
රඳවාගත් ඉපැයුම්		7 800
ඉඩම් ප්‍රත්‍යාගණන සංචිත		1 000
පොදු සංචිතය		1 000
ප්‍රකාශිත ප්‍රාග්ධනය සා.කො.ප්‍රා.		20 000
කල්බදු ගෙවීම්	1 100	
වෙළෙඳ ලැබිය යුතු දෑ	2 100	
වෙළෙඳ ගෙවිය යුතු දෑ		1 550
15% ණයකර		2 000
මුදල් හා මුදල් සමාන දෑ	6 250	
ගෙවූ බදු	10 000	
ආදායම් බදු වෙන් කිරීම (2022 / 2023)		250
2023.04.01 VAT පාලන		3 000
2023.04.01 වගකීම් සහතික වෙන් කිරීම		8 500
ගෙවූ ණයකර පොලී	200	
	197 450	197 450

අතිරේක තොරතුරු,

(i) අවසන් තොගයේ ශුද්ධ උපලබ්ධි අගය 7100 ලෙස ඇස්තමේන්තු කර ඇත.

(ii) මෙම ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇත. ගැණුම් තුළ 7 500 000 VAT ඇතුළත් අතර විකුණුම් වටිනාකමේ 15% ක VAT අගයක් ඇතුළත්ව ඇත.

(iii) 2023.04.01 දේපළ පිරියත උපකරණ හා ඒවායේ සමුච්චිතක්ෂය වටිනාකම් පහත දැක්වේ.

"000"

දේ.පි.උ.	ඉඩම්	ගොඩනැගිලි	මෝටර් රථ	යන්ත්‍ර	එකතුව
පිරිවැය/ප්‍රත්‍යාගණන අගය	30 000	35 000	22 000	10 000	97 000
සමුච්චිත ක්ෂය	-	7 000	4 950	2 400	14 350

2024.3.31 ඉඩම රු.28 500 000 කට දෙවන වර ප්‍රත්‍යාගණනය කරන ලද අතර මීට පෙර සිදු කළ ප්‍රත්‍යාගණනයේ දී ඇති වූ ලාභය ඉඩම් ප්‍රත්‍යාගණන සංචිතයෙන් දැක්වේ.

2024.3.31 ගොඩනැගිලි 25 000 000 කට ප්‍රත්‍යාගණනය කරන ලද අතර 2022/2023 වර්ෂයේ සිදු කළ ප්‍රත්‍යාගණනයෙන් රු.200 000 ක ප්‍රත්‍යාගණන අලාභයක් වාර්තා කර තිබුණි.

(iv) දේපළ පිරියත උපකරණ පිරිවැය මත පහත පරිදි ක්ෂය කරයි.
ගොඩනැගිලි 10%, මෝටර් රථ 15%, යන්ත්‍ර 12%
පැවති යන්ත්‍රය 2023.01.01 8 500 000 කට විකුණා ඇති අතර එදිනම රු.8000 000 කට නව යන්ත්‍රයක් මිලට ගෙන ඇත. මේ සම්බන්ධව කිසිදු සටහනක් පොත්වල වාර්තා කර නැත. නව යන්ත්‍රයේ ඉදිරි ඵලදායි ජීවිත කාලය අවුරුදු 08 කි.

(v) ණයගැතියන්ගෙන් රු.100 000 ක් බොල් ණය ලෙස කපා හැර ඉතිරි ණයගැතියන්ගෙන් 10% ක් වන සේ හානි කරන අලාභ ඉඩහැරිය යුතුවේ.

(vi) විකුණුම් වටිනාකම මත 1% ක් වගකීම් සහතික ප්‍රතිපාදනය කළ යුතු වේ. ගෙවූ වගකීම් සහතික වියදම 1 500 000 ක් බෙදාහැරීමේ වියදම් තුළ ඇතුළත් වේ.

(vii) ගෙවූ ආදායම් බදු තුළ VAT සඳහා ගෙවූ 2 500 000 ක් සහ 2022/2023 වර්ෂය සඳහා ගෙවූ ආදායම් බදු රු.300 000 ක් ඇතුළත් වේ. 2023/2024 සඳහා ඇස්තමේන්තු කළ බදු වියදම රු.12375 000 කි.

(viii) 2023.04.01 බෙදාහැරීම් කටයුතු සඳහා රු.500 000 මූලික ගෙවීමක් කර මෝටර් රථයක් මූල්‍ය කල්බදු ක්‍රමයට ලබා ගත් අතර එදින දරන ලද ඍජු පිරිවැය රු.100 000 කි. රු.500 000 බැගින් සමාන වාර්ෂික වාරික 04 කල්බදු ණය සඳහා ගෙවිය යුතුය. මේ සඳහා ගම්‍ය පොලී අනුපාතිකය 0% වන අතර ඊට අදාළ වට්ටම් සාධකය පහත වේ.

වර්ෂය	1	2	3	4
වට්ටම් සාධකය	0.9	0.8	0.7	0.6

මූලික ගෙවීම, ඍජු පිරිවැය සහ ගෙවන ලද පළමු වාරිකය කල්බදු ගෙවීම් ගිණුමට හර කර ඇත. මේ පිළිබඳ වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(ix) ව්‍යාපාරයේ ගොඩනැගිල්ලෙන් කොටසක් කුලියට දීමෙන් ලද රු.300 000 ක කුලී ආදායම පරිපාලන වියදම් ගිණුමට බැර කර ඇත.

(x) ප්‍රවර්තන වර්ෂය සඳහා උපචිත විගණන ගාස්තුව රු.100 000 කි.

(xi) 2024.3.31 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත තීරණ ගෙන ඇත.

- රඳවාගත් ඉපැයුම් වලින් රු.1 000 000 ක් පොදු සංචිතයට මාරු කිරීම.
- රු.10 000 000 භාවිතා කර ප්‍රසාද කොටස් නිකුතුවක් කිරීම.
- සාමාන්‍ය කොටස් හිමියන්ට කොටසකට රු. 2 බැගින් ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම.

අවශ්‍ය වන්නේ,

(1) 2024.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය.

(2) 2024.3.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය.

(3) 2024.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය.

(ලකුණු 40)

(2).(අ). නිෂ්පාදන කටයුතු වල යෙදෙන සිතුම් සමාගම තම ව්‍යාපාරයේ අමුද්‍රව්‍යයට අදාළව පහත තොරතුරු සපයා තිබේ.

2023.04.01 තොගය ඒකක 1500 (ඒකකයක මිල රු.250)
2023.04.05 ගැණුම් ඒකක 5000 (ඒකකයක් රු.260 බැගින්)
2023.04.07 නිකුත් කිරීම් ඒකක 4500
2023.04.15 ගැණුම් ඒකක 5000 (ඒකකයක් රු.270 බැගින්)
2023.04.20 නිකුත් කිරීම් 3000
2023.04.25 නිකුත් කිරීම් 3000

සමාගම තොග නිකුත් කිරීම සඳහා FIFO ක්‍රමය භාවිතා කරයි.

- තොග මට්ටම් පිළිබඳ තොරතුරු පහත පරිදි ලබා දී ඇත.

	උපරිම	අවම
පරිභෝජනය (සතියක)	8000	3000
පොරොත්තු කාලය (සති)	6	2

ඉහත තොරතුරු ඇසුරෙන් පහත දෑ ගණනය කරන්න.

(i) ගබඩා ලෙජරය පිළියෙළ කර පහත දෑ හි වටිනාකම දක්වන්න.
- 2023.4.30 දින තොගය.
- 2023 අප්‍රේල් මාසයේ නිකුත් කළ තොගයේ වටිනාකම.

(ii) පහත දැක්වෙන තොග මට්ටම් සොයන්න.
- යලි ඇණවුම් මට්ටම
- උපරිම තොග මට්ටම
- අවම තොග මට්ටම
- සාමාන්‍ය තොග මට්ටම

(ආ) සැකසුම්, ඇසුරුම් හා නිමවුම් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු තුනක් සහ ගබඩාව ලෙස සේවා දෙපාර්තමේන්තුවක් පවතින පලතුරු බීම නිෂ්පාදනයේ යෙදෙන නිරෝ සමාගමේ පහත තොරතුරු ඔබට ඉදිරිපත් කර තිබේ.

අයිතමය	සැකසුම්	ඇසුරුම්	නිමවුම්	ගබඩාව
ගණනය කළ පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාත	යන්ත්‍ර පැයකට රු.20	ශ්‍රම පැයකට රු.24	ශ්‍රම පැයකට රු.30	
අයවැය ගත පැය ගණන				
යන්ත්‍ර පැය	10 000	12 000	9 000	
ශ්‍රම පැය	12 000	8 000	7 000	
බිම් ප්‍රමාණය වර්ග මීටර්	24 000	16 000	8 000	8 000
සේවක සංඛ්‍යාව	30	24	12	6
ගබඩා අධියාචනාපත්	2	1	1	

(1) ඉහත අන්තර්ග්‍රහන අනුපාත ගණනය කිරීමේ දී පහත අයිතම මඟහැරී ඇති බව පසුව හඳුනා ගන්නා ලදි.
- කර්මාන්ත ශාලා කුලිය රු.350 000/=
- වක්‍ර වේතන රු.360 000
- වැරදීමකින් සැකසුම් අංශයට ප්‍රතිපාදනය කර ඇති නිෂ්පාදන නොවන ස්ථාවර පිරිවැය රු.40 000
- අයවැය ගත නිෂ්පාදන ඒකක ගණන (බීම බෝතල්) 5000

(2) ව්‍යාපාරය විසින් නිපදවීමට අපේක්ෂිත A නැමති බීම බෝතලයකට අදාළ පිරිවැය තොරතුරු පහත දැක්වේ.

<u>ප්‍රාථමික පිරිවැය</u>	A	
සෘජු ද්‍රව්‍ය	50	
සෘජු ශ්‍රමය	<u>70</u>	120

<u>නිෂ්පාදන පොදු කාරය පිරිවැය</u>		
සැකසුම්	40	
ඇසුරුම්	12	
නිමවුම්	30	82
මුළු නිෂ්පාදන පිරිවැය		202
නිෂ්පාදන නොවන පොදු කාර්ය		
විචලා		18
මුළු නිෂ්පාදන පිරිවැය		220

අවශ්‍ය වන්නේ,

(1) ඉහත මහ හැරීම් ද සැලකිල්ලට ගනිමින් නිෂ්පාදන පොදු කාර්ය විශ්ලේෂණ පත්‍රිකාව.

(2) සංශෝධනය කරන ලද අන්තර්ග්‍රහන අනුපාත.

(3) බීම බෝතලයක සංශෝධිත මුළු පිරිවැය.

(4) පිරිවැය මත 30% ක ලාභ සහිතව බීම බෝතලයක් අලෙවි කරයි නම් බීම බෝතලයේ විකුණුම් මිල කොපමණ ද? (ආසන්න රුපියලට)

(3).(අ).ආශිගේ ව්‍යාපාරයේ 2024.03.31 මූලා තත්ව ප්‍රකාශය පහත දැක්වේ.

	"000"
දේපළ පිරියත උපකරණ (ධාරණ අගය)	2500
තොගය	175
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	325
මුදල්	120
මුළු වත්කම්	3120
හිමිකම	2190
බැංකු ණය	500
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	430
මුළු හිමිකම් හා වගකීම්	3120

2024 අප්‍රේල් මාසය තුළ දී පහත ගනුදෙනු ව්‍යාපාරයේ සිදු විය.

(1) ලැයිස්තුගත මිල 2 000 000 ක් වූ තොගයක් 10% ක වෙළඳ වට්ටමකට යටත්ව ණයට මිලදී ගැනීම.

(2) පිරිවැය රු.900 000 ක් වූ තොගයක් විකුණුම් මිලට 25% ක ලාභයක් සහිතව අත්පිට මුදලට විකිණීම.

(3) අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් ලබාගත් භාණ්ඩ රු.20 000 ක් වන අතර අමතර ප්‍රාග්ධනය ලෙස ව්‍යාපාරයට යෙද වූ මුදල රු.100 000 ක් වේ.

(4) මූලා කල්බදු පදනම මත ව්‍යාපාරයේ භාවිතය සඳහා රු.1200 000 ක් පිරිවැය වූ මෝටර් රථයක් රු.200 000 ක මූලික ගෙවීමක් කර ලබා ගැනීම.

(5) භාවිත අයිතිය සහිතව ලබාගත් මෝටර් රථයේ ඉදිරි ඵලදායි ජීවිත කාලය වසර 05 ක් ලෙස ඇස්තමේන්තු කර ක්ෂය ගණනය කළ යුතු වේ.

(6) අනෙකුත් දේ.පි.උ. වාර්ෂික ක්ෂය, පිරිවැය මත 12% ක් වේ.

(7) පිරිවැය රු.600 000 ක් වූ භාණ්ඩ තොගයක් විකුණුම් මිලට 25% ක ලාභයක් සහිතව ණයට විකිණීම.

(8) මාසික කල්බදු වාරිකය රු.30 000 ක් ගෙවූ අතර එහි ඇතුළත් පොලිය රු.10 000 ක් වේ.

(9) පිරිවැය 60 000 ක් වූ තොගයක් ගනුදෙනුකරුවන් විසින් හරවා එවීම.

(10) වෙළඳ ණයහිමියන්ගෙන් හරි අඩක් 10% ක ලද වට්ටමක් සහිතව පියවා දැමීම.

(11) රු.500 000 ක වෙළඳ ණයගැතියන් පියවීමේ දී ලබා දුන් වට්ටම 8%.

(12) අප්‍රේල් මාසය සඳහා මෙහෙයුම් වියදම රු.300 000 කි. ඉන් 75% ක් පමණක් මුදලින් මේ වන විට ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ,

(1) ඉහත 1 සිට 12 දක්වා ගනුදෙනුවල බලපෑම අගයන් සහිතව පහත දැක්වෙන ආකෘතියට අනුව ගිණුම්කරණ සමීකරණය තුළ දැක්වීම. (අප්‍රේල් මාසය තුළ)

දේපළ පිරියත උපකරණ	තොගය	වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	මුදල්	බැංකු ණය	වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	හිමිකම

(2) ආදායම් ප්‍රකාශය ඇසුරෙන් අප්‍රේල් මාසය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය.

(මුළු ලකුණු 30)

(ආ) පහත දැක්වෙන්නේ LION ක්‍රීඩා සමාජයේ 2024.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් සම්බන්ධ තොරතුරු වේ. මුළු සාමාජිකයන් ගණන 125 ක් වන අතර වාර්ෂික සාමාජික මුදල රු.6000/- ක් වේ.

මුදල් ලැබීම්	"000"	
සාමාජික මුදල්	744	
තරඟ ආදායම්	500	
ආපනශාලා විකුණුම් ආදායම	700	
ක්‍රීඩා උපකරණ ලබා ගැනීමට පරිත්‍යාග	1500	3444
මුදල් ගෙවීම්		
ආපනශාලාව සඳහා ආහාර	380	
ආපනශාලාව සඳහා වෙනත් වියදම්	100	
පරිපාලන වියදම්	70	
ක්‍රීඩා තරඟ වියදම්	150	
ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම	1000	
ගොඩනැගිලි ඉදිකිරීම	1200	(2900)
		544
2023.04.01 මුදල් ශේෂය		200
2024.03.31 මුදල් ශේෂය		744

අතිරේක තොරතුරු,

(i) ආරම්භක හිඟ සාමාජික මුදල රු.30 000 ක් විය. එදින කලින් ලද සාමාජික මුදල රු.12 000 කි. ආරම්භක හිඟ සාමාජිකයන්ගෙන් තිදෙනෙකු ප්‍රවර්තන වර්ෂය සඳහා ද සාමාජික මුදල් ලබා නොදීම හේතුවෙන් 2024.3.31 ඔවුන්ගේ සාමාජිකත්වය අහෝසි කොට හිඟ සාමාජික මුදල් කපා හැරීමට තීරණය කරන ලදි. 2024.3.31 ඉදිරි වර්ෂය සඳහා සාමාජිකයන් 6 දෙනෙකු මුදල් ලබා දී ඇත.

(ii) ආපනශාලාව සඳහා උපචිත වියදම 2024.03.31 දිනට රු.20 000 කි.

(iii) ක්‍රීඩා උපකරණ ලබා ගැනීමට ලද පරිත්‍යාග ලද වසරේ සිට වසර 3 ක් තුළ ආදායමේ හඳුනා ගැනීමට තීරණය කර ඇත.

(iv) 2023.04.01 ක්‍රීඩා උපකරණවල ධාරණ අගය 500 000 ක් වූ අතර 2024.03.31 ධාරණ අගය ර.1200 000 ක් විය.

(v) ගොඩනැගිල්ල 2023.10.1 ඉදිකර අවසන් ව අතර එදින සිට වසර 10 ක් ඵලදායි ජීව කාලයක් සහිත වේ.

අවශ්‍ය වන්නේ,

(1) සාමාජික මුදල් ගිණුම

(2) 2024.3.31 අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනය.

(4). (අ). සීමිත අරලිය ව්‍යාපාරයේ 2024.3.31 අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා තිබේ. මෙම ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වී ඇත. VAT අනුපාතය 15% කි.

2023.04.01 දිනට පැවති ගිණුම් ශේෂ

මුදල්	රු.450 000
වෙළඳ ලැබිය යුතු දෑ	රු.360 000
වෙළඳ ගෙවිය යුතු දෑ	රු.325 000
VAT පාලන ගිණුම බැර ශේෂය	රු.75 000

අප්‍රේල් මාසය තුළ පහත ගනුදෙනු සිදු විය.

- වෙළඳ ලැබිය යුතු දෑ සම්බන්ධ ගනුදෙනු

නම	(VAT සහිත) විකුණුම් වට්නාකම	(VAT සහිත) ආපසු එවුම්	ලද මුදල්	දුන් වට්ටම්
හිරුණි	184 000	13 800	76 000	4 000
වරුණි	230 000	23 000	95 000	5 000
සඳුනි	207 000	34 500	67 000	3 000

- වෙළෙඳ ගෙවිය යුතු දෑ සම්බන්ධ ගනුදෙනු

	ගැණුම් (VAT සහිත)	ආපසු එවුම්	ගෙවූ මුදල්	ලද වට්ටම්
අනුර	115 000	9 200	30 000	1 500
බිනුර	345 000	46 000	150 000	7 500
චනුර	287 500	29 900	200 000	10 000

- ව්‍යාපාර තුළ මුදලින් සිදු වූ අනෙකුත් ගනුදෙනු

අත්පිට විකුණුම්	460 000 (15% VAT සහිතව)
අත්පිට ගැණුම්	345 000 (15% VAT සහිතව)
මෙහෙයුම් වියදම්	60 000 (VAT අදාළ නොවේ)
බැංකු ණය ගැනීම	500 000
VAT ගෙවීම	75 000

- මෙම ව්‍යාපාරයේ වෙළඳ ලැබිය යුතු දෑ පාලන ගිණුමේ ශේෂය එදිනට ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තුව සමඟ එකඟ නොවුණි. වෙනසට හේතු පහත පරිදි අනාවරණය විය.
  - ආරම්භයේ සිටි ණයගැතියන්ගෙන් රු. 10000 වූ ණයගැතියෙක් බුන්වත් වී ඇති අතර එය ණයගැති පෞද්ගලික ගිණුමේ පමණක් සටහන් කර ඇත. ණයගැති පාලන ගිණුමට ගෙන නැත.
  - ණයගැති හිරුණිගෙන් ලද 76000 ක මුදල උප ලෙජරයේ ඇයගේ ගිණුමේ 67000 ක් ලෙස සටහන් කර ඇත.
  - වරුණිට දුන් වට්ටම රු.5000 පාලන ගිණුමේ සටහන් කළ ද ඇයගේ ගිණුමේ සටහන් කර නැත.

අවශ්‍ය වන්නේ,

(1) i. මුදල් ලැබීම් ජ'නලය
   ii. මුදල් ගෙවීම් ජ'නලය
   iii. විකුණුම් ජ'නලය
   iv. ගැණුම් ජ'නලය
   v. ආපසු යැවුම් ජ'නලය
   vi. ආපසු එවුම් ජ'නලය

(2) පහත දැක්වෙන ලෙජර් ගිණුම්
   i. මුදල් පාලන ගිණුම
   ii. ණයගැති පාලන ගිණුම
   iii. ණයහිමි පාලන ගිණුම
   iv. VAT පාලන ගිණුම

(3) i. ණයගැති පාලන ගිණුම සංශෝධනය
   ii. සංශෝධිත ණයගැති පාලන ගිණුමේ ශේෂයෙන් ආරම්භ කොට ණයගැති ශේෂ සැසඳුම් ලේඛනය.

(ලකුණු 30)

(ආ). ජනලංකා ව්‍යාපාරයේ 2024.01.31 දින මුදල් ගිණුමේ ශේෂය රු.38000 ක් විය. නමුත් එදිනට බැංකු ප්‍රකාශයේ ශේෂය ඊට වෙනස් විය. වෙනසට හේතු වූ කරුණු පහත පරිදි හඳුනාගෙන ඇත.

- තැන්පත් කළ චෙක්පත් වල වටිනාකම — රු. 750 000
- නිකුත් කළ චෙක්පත් වල වටිනාකම — රු. 627 000
- බැංකුව වෙත ලද ණයගැති සෘජු ප්‍රේෂණය — රු. 50 000
- ස්ථාවර නියෝග මත බැංකුව විසින් ගෙවා ඇති බැංකු ණය වාරිකය — රු. 32 000
- බැංකු ගාස්තු රු.3000 ක් අයකරගෙන ඇත.
- පෙර මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශය (2023.12.31 අවසන් මාසයේ) පිළියෙළ කිරීමට හේතු වූ කරුණු පහත දැක්වේ.
    1. නිකුත් කළ නමුත් බැංකුව ඉදිරිපත් නොවූ චෙක්පත් — රු.18 000
    2. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් — රු.10 000
- ජනවාරි මාසය තුළ බැංකුවට බැර වී ඇති වටිනාකම ණයගැති සෘජු ප්‍රේෂණය හැර රු.700 000 කි.
- ජනවාරි මාසය තුළ චෙක්පත් සඳහා කළ ගෙවීම් රු.560 000 ක් වේ.

අවශ්‍ය වන්නේ,

1. මුදල් පාලන ගිණුම සංශෝධනය කිරීම.
2. 2024.01.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙළ කිරීම.

(ලකුණු 10)

(5).(අ). චමීෂා, දිලීෂා සහ එලීෂා විසින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයෙන් එලීෂා 2024.03.31 දින විශ්‍රාම ගන්නා ලදි. මොවුන්ගේ හවුල් ගිවිසුමේ කොන්දේසි පහත වේ.

- ලා/ලා අනුපාතය 5 : 3 : 2 විය.
- ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 10% පොලී හිමි වේ.
- ප්‍රාග්ධනයට අමතරව සපයන ණය සඳහා වාර්ෂික පොලිය 12%
- චමීෂාට මසකට රු.30 000 ක් ද, එලීෂාට රු.25 000 ක් ද බැගින් හවුල් වේතන හිමි වේ.

එලීෂා හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා දිනයේ දී ඇයගේ කීර්ති නාම කොටස 150 000 ක් විය. ඇය විශ්‍රාම ගත් පසු චමීෂා හා දිලීෂා 3 : 2 අනුපාතයට ලාභාලාභ බෙදා ගැනීමටත් අනෙකුත් කොන්දේසි එලෙසම පවත්වා ගැනීමටත් එකඟ විය.

2024.03.31 දිනට ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත වේ. රු. **"000"**

	හර	බැර
දේපළ පිරියත උපකරණ (පිරිවැයට)	13 000	
දේපළ පිරියත උපකරණ සමුච්චිත ක්ෂය (2023.4.1)		3 000
විකුණුම්		15 000
ගැණුම්	8 500	
2023.4.1 තොගය	760	
මුදල්	3 500	
ප්‍රාග්ධන ගිණුම් 2023.04.01		
චමීෂා		5 000
දිලීෂා		3 000
එලීෂා		2 000
ජංගම ගිණුම් 2023.4.1		
චමීෂා		100
දිලීෂා	150	
එලීෂා		120
වැටුප්	1 330	
ණය ගිණුම - චමීෂා (2023.10.1 සැපයූ)		500
මෙහෙයුම් වියදම්	1 200	
ණයගැති	800	
ණයහිමි		500
දුන් වට්ටම්	60	
ලද වට්ටම්		80
	29 300	**29 300**

අතිරේක තොරතුරු,

(i) කීර්ති නාමය ප්‍රාග්ධන ගිණුමේ ගැලපිය යුතු වේ.

(ii) හවුල්කරුවන් සඳහා ගෙවන ලද මාස 06 ක වැටුප්, වැටුප් ගිණුමට හර කර ඇත.

(iii) දේපළ පිරියත උපකරණ වාර්ෂිකව පිරිවැය මත 10% බැගින් ක්ෂය කරනු ලබයි. 2024.01.01 දින රු.2 000 000 ක් වන මෝටර් රථයක් හවුල් ව්‍යාපාරය සඳහා මිල දී ගෙන ඇති අතර ඒ පිළිබඳ කිසිදු සටහනක් තබා නොමැත. මෙම මෝටර් රථයේ සුන්බුන් අගය 200 000 වන අතර ඵලදායි ජීවිත කාලය වසර 10 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(iv) මෙහෙයුම් වියදම් තුළ ඉදිරියට ගෙවන ලද රු.350 000 ක කුලී වියදමක් ඇතුළත් වේ.

(v) 2024.03.31 දිනට භෞතිකව පැවති අවසන් තොගය රු.300 000 කි.

(vi) විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත නිමේෂාට යැවූ පිරිවැය 200 000 ක් වූ භාණ්ඩ ණයට විකුණුම් ලෙස වාර්තා කර ඇත. මෙම භාණ්ඩ ඉන්වොයිස් කර ඇත්තේ විකුණුම් මිලට 20% ක ලාභ ප්‍රතිශතයක් එකතු කරමින් ය. මෙම භාණ්ඩ තවම විකුණා හෝ ඉඩදුන් කාලය අවසන් වී නොමැත.

(vii) එලීෂා විශ්‍රාම ගන්නා දිනට ධාරණ අගය 1 500 000 ක් වූ මෝටර් රථයක් පවරා දුන් අතර ඉතිරිය ණය ගිණුමකට මාරු කිරීමට තීරණය විය. ඇයට ගෙවිය යුතු පොලිය 8% කි.

අවශ්‍ය වන්නේ,

(1) 2024.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලා/ලා ප්‍රකාශය.

(2) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම්

(3) එලීෂාගේ ණය ගිණුම.

(ආ). අධ්‍යාපන ආයතනයක් විසින් අ.පො.ස.(උ/පෙළ) වාණිජ සිසුන් සඳහා විෂයන් 03 සඳහා ම තෙදින සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කිරීමට අපේක්ෂා කරයි. සිසුන් 250 සහභාගි වෙතැයි අපේක්ෂා කරයි.

සම්මන්ත්‍රණය සඳහා අදාළ පහත තොරතුරු සපයා තිබේ.

- සම්පත් දායකයින් තිදෙනෙක් දිනකට එක් අයෙකු බැගින් සම්බන්ධ වන අතර එක් අයෙකුගේ ගාස්තුව රු.10 000 බැගින් වේ.
- ශාලා ගාස්තුව දින තුන සඳහා ම රු.25 000
- ප්‍රචාරණ ගාස්තුව රු.10 000
- ශබ්දවාහිනී දින තුන සඳහා ම රු.7 500
- විදුලි ගාස්තුව රු. 2 500
- සහයකයින් සඳහා එක් අයෙකුට දිනකට රු.2 000 බැගින් වේ. සහයකයින් දෙදෙනෙක් සේවයේ යොදවයි.

සහභාගි වන සිසුන් සඳහා අපේක්ෂිත වියදම් පහත වේ.

- එක් සිසුවෙකුගේ සංග්‍රහ වියදම දිනකට රු.300
- එක් සිසුවෙකුගේ නිබන්ධන පිරිවැය විෂයන් තුන සඳහා ම 500
- ලිපිගොනු කවරය සඳහා එක් අයෙකුට රු.100
- එක් අයෙකුගෙන් (දින තුන සඳහා ම) අය කිරීම රු.2000/=

අවශ්‍ය වන්නේ,

(1) ස්ථාවර පිරිවැය හා විචලා පිරිවැය අයිතම වෙන වෙනම දක්වමින්

(2) මුළු පිරිවැය ආවරණය කර ගැනීම සඳහා සහභාගි විය යුතු සිසුන් ගණන.

(3) සිසුන් 250 සහභාගි වන්නේ නම් ලැබෙන ලාභය

(4) රු.25 000 ක ලාභයක් ඉපැයීමට සහභාගි විය යුතු සිසුන් ගණන.

(5) දැනට තෝරාගෙන ඇති සම්මන්ත්‍රණ ශාලාව වෙනුවට ඊට වඩා පහසුකම් සහිත ශාලාවක් තෝරා ගැනීමට පවතින අතර ඒ සඳහා ශාලා කුලිය තවත් රු.13 000 කින් වැඩි වේ. එම ශාලාව තෝරා ගැනීම සිදු වන්නේ නම් සහ සිසුන් 200 ක් සහභාගි වන්නේ නම් හා රු.20 000 ක ලාභයක් ලැබීමට අපේක්ෂිත නම් සිසුවෙකුගෙන් අය කළ යුතු මුදල කොපමණ ද?

(6).(අ). සීමිත රෝයල් සමාගමේ 2023.4.1 හා 2024.3.31 මූල්‍ය තත්ව ප්‍රකාශනයේ තොරතුරු පහත දී ඇත.

	2024.3.31	2023.4.1
ජංගම නොවන වත්කම්		
දේපළ පිරියත උපකරණ	23500	25000
දේපළ පිරියත උපකරණ ක්ෂය	(4 710)	(6250)
ස්ථාවර තැන්පතු	1000	1000
ජංගම වත්කම්		
තොගය	1200	500
වෙළඳ ලැබිය යුතු දළ (ණයගැති)	2000	1600
මුදල් හා මුදල් සමාන දෑ	4430	750
	27420	**22600**
හිමිකම		
සා.කො.ප්‍රාග්ධනය	13000	12000
රඳවාගත් ඉපැයුම්	8840	5390
ප්‍රත්‍යාගණන සංචිත	300	-
පොදු සංචිතය	500	-
ජංගම නොවන වගකීම්		
12% බැංකු ණය	3000	2000
ජංගම වගකීම්		
වෙ/ගෙ/යුතු දෑ (ණයහිමි)	1000	2450
උපචිත පරිපාලන	450	400
උපචිත බදු	250	300
උපචිත ණය පොලී	80	60
	27420	**22600**

රෝයල් සමාගම
2024.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභාලාභ ප්‍රකාශනය.

විකුණුම්	18500
(-) විකුණුම් පිරිවැය	9300
දළ ලාභය	9200
වෙනත් ආදායම්	500
බෙදාහැරීමේ වියදම්	(2200)
පරිපාලන වියදම්	(1400)
මූල්‍ය වියදම්	(360)
වෙනත් වියදම්	(340)
බදු පෙර ලාභය	5400
(-) ආදායම් බදු	(1250)
කාලච්ඡේදයේ ලාභය	4150
වෙනත් විස්තීර්ණ ආදායම්	300
මුළු විස්තීර්ණ ආදායම	4450

අතිරේක තොරතුරු,

(1) 2020.04.01 රු.8 000 000 මිල දී ගත් මෝටර් රථයක් 2023.10.01 දින රු.400 ක ලාභයක් සහිතව අලෙවි කරන ලදි. මෙම මෝටර් රථය පිරිවැය මත 10% බැගින් ක්ෂය කරයි. එසේම එදිනම පිරිවැය 6 000 000 ක් වූ නව මෝටර් රථයක් මිලට ගත් අතර එහි ඵලදායි ජීවිත කාලය වසර 10 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

(2) රු. 5 000 000 වූ ඉඩම 2023.4.1 දින දෙවන වර රු.5 500 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදි. මෙම ඉඩම පළමු වර 2022 වසරේ ප්‍රත්‍යාගණනය කළ අතර එහිදී රු.200 000 අලාභයක් වාර්තා කර තිබුණි.

(3) මෝටර් රථ හැර අනෙකුත් සියලු දේපළ පිරිවැය මත 8% බැගින් වාර්ෂිකව ක්ෂය කරයි.

(4) ස්ථාවර තැන්පතු සඳහා ලද රු.100 000 ක පොලී ආදායම වෙනත් ආදායම් තුළ ඇතුළත්ව ඇත.

(5) මෝටර් රථ ක්ෂය බෙදාහැරීම් වියදම් තුළ ද අනෙකුත් වත්කම් ක්ෂය පරිපාලන වියදම් තුළ ද ඇතුළත්ව ඇත. මූල්‍ය වියදම් තුළ නිරූපණය වන්නේ බැංකු ණය සඳහා අදාළ පොලිය වේ.

(6) ව්‍යාපාරය විසින් සාමාන්‍ය කොටස් හිමියන්ට ලාභාංශයක් ගෙවා ඇත.

(7) සියලු විකුණුම් ණය පදනම මත වේ.

අවශ්‍ය වන්නේ,

(1) LKAS 07 අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් වක්‍ර ක්‍රමයට දක්වමින් 2024.3.31 අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය. (ලකුණු 20)

(2) පහත දැක්වෙන ගිණුම්කරණ අනුපාත ගණනය කිරීම.

1. තොග පිරිවැටුම් අනුපාතය
2. ණයගැති පිරිවැටුම් අනුපාතය
3. පොලී ආවරණ අනුපාතය
4. ශුද්ධ ලාභ අනුපාතය
5. හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය

(ලකුණු 10)

(ආ). අනුර සමාගම ආයෝජන ව්‍යාපෘතියකට අදාළව පහත තොරතුරු ඔබට ඉදිරිපත් කර තිබේ. ව්‍යාපෘතියට අදාළ ඵලදායි කාලය අවුරුදු 5 කි.

- දැනටමත් දරා ඇති සමීක්ෂණ පිරිවැය රු.250 000/-
- මූලික ආයෝජනය රු.1 000 000 ක් වේ.
- කාරක ප්‍රාග්ධනය මූලික ආයෝජන අවස්ථාවේ දී 150 ක් වන අතර තෙවන වසරේ දී 50 ක් දැරිය යුතුය. මෙම සම්පූර්ණ අගයෙන් 75% ක් අවසානයේ දී නැවත ලබාගත හැකිය.
- ව්‍යාපෘතියේ සුන්බුන් අගය රු.200 000 කි.
- ව්‍යාපෘති කාලය තුළ විකුණුම් ඒකක අපේක්ෂිත ප්‍රමාණ පහත වේ.

වර්ෂය	**1**	**2**	**3**	**4**	**5**
අපේක්ෂිත විකුණුම් ඒකක	400	420	450	550	500

- එක් ඒකකයක විකුණුම් මිල රු.1000 ක් වන අතර ඒකකයක විචල්‍ය පිරිවැය රු.500 කි. සෑම වර්ෂයකම 100 000 බැගින් ස්ථාවර පිරිවැයක් දරයි. ක්ෂය විචල්‍ය පිරිවැයෙහි ඇතුළත් වේ.
- ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% කි. එහි වට්ටම් සාධකය පහත දැක්වේ.

වසර	**1**	**2**	**3**	**4**	**5**
වට්ටම් සාධකය	0.91	0.83	0.75	0.68	0.62

අවශ්‍ය වන්නේ,

(1) ව්‍යාපෘතියේ මුදල් ගාල ඒම් සහ ගලා යාම්.

(2) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය (NPV) හා ඒ මත ගනු ලබන තීරණය

(3) ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය.

PAST PAPERS WIKI

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk BookStore

විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න

කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න